සම්මාන අලකලංචියේදී බූන්දිය සුනිල් ගෝවින්නයන්ට එරෙහිව සංවිධානාත්මකව ප්‍රහාර එල්ල කරද්දී කිසියම් අවස්ථාවක එම අතරමැදි වීම සමථයකට පත් කරන්නට නොබියව ඉදිරිපත් වූයේ ද රසික සූරියආරච්චිම ය. එනමුත් මෙම ගොඩගේ සම්මාන අලකලංචියෙන් තම කීර්ති නාමය හානි කරගන්නට සුනිල් ගෝවින්නයන් අවිඥානිකව සැරසෙන්නට මාසයකට පමණ පෙරය දකුණු කුරු දිවි කවි පොත මුද්‍රණයට සංවිධානය වන්නේ. එනයින් ඒවා අතර සම්බන්ධයක් ද නොපෙනේ. කෙසේ වුවද සුනිල් ඕස්ට්‍රේලියාව නියෝජනය කරන සිංහල සහ ඉංගිරිසි බසින් කාව්‍යකරණයේ යෙදෙන්නකු බැව් ප්‍රකටය. ඔහු ගොඩගේ සම්මාන නාටකයේ විශිෂ්ටතම කවියා යැයි කැලිබර් වීම අනුමත කිරීමක් මගේ නොමැත.

ජගත් ජේ එදිරිසිංහද කාලාන්තරයක් අඛණ්ඩව නිර්මාණකරනයේ යෙදීමෙන් අවංකව සිය කීර්තිය උපයා ගත් ඔසී රට කිවියෙකි. සයිබරයේ වඩාත් ප්‍රචලිත මේ දෙදෙනා ද මග හැර ඕස්ට්‍රේලියානු සිංහල කවි පොතක් සංස්කරණය කරමින් එක්කෝ රසික සූරියආරච්චි කර ඇත්තේ අභියෝගාත්මක ප්‍රචණ්ඩ ආස්ථානයක් තුළ ඔවුන් මකා දැමීමකි. නොඑසේ නම් සම සංස්කාරක හෙන්රි ගේ අතරමැදි වීමකින් හටගත් වැසිය නොහැකි අගාධයකි. හෙන්රි ගේ කවි පංති දහතුනකට ඉඩ ලද තැන කවියන් දෙදෙනකුගේ කවි දෙකකට ඉඩ මග හැරී යාම අතාත්විකය. මේ දේශපාලන පසමිතුරුභාවය මතු වීමක් නම් මා හට කීමට ඇත්තේ කරුණාකර බුදුන් වැඳ කවි ලියා අපිව ගොනාට ඇන්දවීමෙන් වලකින ලෙසය. මන්ද යත් බුදුන් සිහිකර කවි පොත් අච්චු ගසා මිලේච්ඡ ප්‍රචණ්ඩත්වය වසා දමා ගන්නා පරණ ක්‍රම 2011ට අදාල නැති බැවිනි. මේ ගැන පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙමි. 74 පිටුවේ පහළින් මුද්‍රණය කර ඇති හෑල්ල උපුටා දක්වා ප්‍රහසනාත්මක හේතු ඉදිරිපත් නොවේ යැයි උදක්ම කල්පනය කරමි. මෙම කෘතිය සම්පාදනය කොට මුද්‍රණය කිරීම අතිශය හදිසියේ කළ වැඩක් නිසාවෙන් මේ කවියන් දෙපළ මගහැරී ඇතැයි මම උපකල්පනය නොකරමි. එබඳු පිළිතුරකට සංවිධානය කළ හැකි "අදිසි හදිසිය" කුමක්දැයි මගේ සංකේතීකරණ විශ්වය තුළ සංකල්පිය කර වටහා ගත නොහැකි බැවිනි.

කවිය දිව්‍යමය ප්‍රචණ්ඩත්වයේ තවත් මානයක හැසිරෙන හැටි සාධනය කරන මේ අපූරු ඓතිහාසික කවි පොත දැන් පොත් කඩවල රාක්කවල තණ්හා *රති *රඟා සඟවා භාවනා කරනු ඇත.

*විශේෂ ස්තුතිය*

*මේ කාව්‍ය සංග්‍රහය මා නිවසට තැපැල් කර එවූ රසික සූරියආරච්චිට හදපිරි ස්තුතිය පුද කරමි. උපුටා ගත් කවි වල කතෘවරුන් සැමට මාගේ ස්තුතිය.*





For Advertise in Sannasa please call
03 8707 4604 / 0402 025 516




